බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන
බඳවා ගැනීමේ පරිපාටිය.

01.සම්බන්ධවන ආයතන

1.1. දෙපාර්තමේන්තුව : බන්ධනාගාර යොමු අංකය : ඩී8/21/බ.පරි/අ.ශි.සේවා දිනය:2017.12.14.

1.2. අමාත්‍යාංශය :බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය. යොමු අංකය :MPRRH/6/2/pri/ ප්‍රා.අර්ධශි/සේවා ගණය දිනය :2014.10.20

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/B2/48/01/Vol -II දිනය:2013.09.24

1.4. ආයතන අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : EST-2/RECRU/05/4860 දිනය:2014.12.01

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NPC/6/18/096/SR-II දිනය:2014.12.31
NPC/6/18/096/SR-II දිනය:2017.07.14

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය: යොමු අංකය : PSC/EST/07-01-27/01/2018 දිනය:2018.04.05

02. . පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : ප්‍රාථමික - අර්ධ ශිල්පීය

3.2. ශ්‍රේණි : III, II, I,
විශේෂ ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : බන්ධනාගාර ආයතනයන් හි කාර්යන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රවාහන නඩත්තු හා අළුත්වැඩියා වැනි කාර්යන් අතරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) දෙවනි හෝ තුන්වෙනි මට්ටමට නොඅඩු මට්ටමකට ප්‍රවීණතා /කාර්මික නිපුණතාවයක් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට අයත් වේ.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත
සටහන: විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

05. වැටුප් :

5.1. වැටුප් කේත අංකය : PL 2- 2016

5.2. වැටුප් පරිමාණය : 25,250 – 10 x 270 – 10 x 300 -10 x 330 – 12 x 350– 38,450/-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 25,250/- |
| II | පියවර 12 | 28,250/- |
| I | පියවර 22 | 31,280/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | 34,600/- |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යන් :

| අනුමත තනතුරු සඳහා | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ට්‍රැක්ටර් රියදුරු | III, II, I විශේෂ ශ්‍රේණිය | 26 | ප්‍රවාහන හා කෘෂිකර්ම කටයුතු. |
| ත්‍රිවිල් රියදුරු | | 08 | |
| මෝටර් කාර්මික | III, II, I විශේෂ ශ්‍රේණිය | 10 | දෙපාර්තමේන්තුවේ වාහන නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු. |
| මෝටර් කාර්මික (විදුලි) | | 04 | |
| මෝටර් කාර්මික (වෑද්දුම්) | | 02 | |
| මෝටර් කාර්මික (පින්තාරු ) | | 02 | |
| | | 52 | |

**සටහන:** උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ යන ශ්‍රේණි සියල්ලම ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

6.2. ඒකාබද්ධ නිලධාරි සංඛ්‍යාව : ට්‍රැක්ටර් රියදුරු - 26
ත්‍රිවිල් රියදුරු - 08
මෝටර් කාර්මික - 10
මෝටර් කාර්මික (විදුලි) - 04
මෝටර් කාර්මික (වෑද්දුම්) - 02
මෝටර් කාර්මික (පින්තාරු) - 02

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7. 2. 1. බඳවා ගන්නා ශ්‍රේණිය : III

**7. 2. 2. සුදුසුකම් :**

7. 2. 2. 1. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) ක් සමත්ව

තිබීම.

7. 2. 2. 2. වෘත්තිය සුදුසුකම් 1. ට්‍රැක්ටර් / ත්‍රීවීල් රියදුරු
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල ට්‍රැක්ටර් / ත්‍රීවිල් (තනතුරට අදාලව) රථ පැදවීමේ වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

2. මෝටර් කාර්මික / මෝටර් කාර්මික (විදුලි) / මෝටර් කාර්මික(වෑද්දුම්)/ මෝටර් කාර්මික (පින්තාරු).
වෘත්තියට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවන හෝ තුන්වන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතුය (සහතික මගින් සනාථ කළ යුතුය.

7. 2. 2 . 3. පළපුරුද්ද
I. ට්‍රැක්ටර් / ත්‍රීවීල් රියදුරු
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල ට්‍රැක්ටර් / ත්‍රීවිල් රථ පැදවීමේ වලංගු බලපත්‍රය ලබා ගැනිමෙන් පසු අදාල තනතුරේ වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.

II.. මොටර් කාර්මික / මෝටර් කාර්මික (විදුලි)/ මෝටර් කාර්මික(වෑද්දුම්)/ මෝටර් කාර්මික (පින්තාරු)
රජයේ පිලිගත් ආයතනයක අදාල වෘත්තිය පිලිබඳ වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය. (ඉහත I හා II පලපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

7. 2. 2. 4. කායික සුදුසුකම් අනුව : උස අඩි 5 අහල් 4 නොඅඩුව තිබිය යුතුය.
පපුව අහල් 32 ට නොඅඩු විය යුතුය.

7. 2. 2. 5. වෙනත් :
1. ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි.
2. මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුය. එය පොලිස් නිශ්කාෂණ වාර්තාවක් මඟින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
3. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීම් නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7. 2. 3. වයස
7. 2. 3. 1. අවම වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු.
7. 2. 3. 2. උපරිම වයස් සීමාව : අවුරුදු 45 ට නොවැඩි.

7. 2. 4. බඳවා ගැනීමේ ක්‍රමය : ප්‍රායෝගික පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවය අනුව පුරප්පාඩු වලට තෝරා ගනු ලැබේ.

7. 2. 4. 1. ලිඛිත විභාගය : අදාළ නොවේ.

7. 2. 4. 2. ප්‍රායෝගික පරීක්ෂණය : එක් එක් තනතුරට අදාළ ලකුණු පරිපාටිය ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.

සටහන

1. විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුලත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.
2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත් කිරීමේ බලධරයා විසින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.
3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා නොදිය යුතුය.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ඇමුණුම 01 බලන්න. | 100% | 40% |

7.2.4.2.1. පවත්වන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්.

7.2.4.3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| අමතර වෘත්තීය සුදුසුකම් | 10 | |
| සේවා පළපුරුද්ද | 35 | |
| ක්‍රීඩා | 20 | |
| චරිත වර්ධන නායකත්වය | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා | 05 | |

සටහන :

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුලත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.( මූලික සුදුසුකම සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ)
2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.
3. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් සිදු කරනු ලැබේ.

7.2.4.3.1. පවත්වන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I කාර්යක්ෂමතා කඩඉම. | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ගත වීමට පෙර | ප්‍රායෝගික |
| II වන කාර්යක්ෂමතා කඩඉම. | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03)ක් ගත වීමට පෙර | ලිඛිත |
| III වන කාර්යක්ෂමතා කඩඉම. | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05)ක් ගත වීමට පෙර | ලිඛිත |

ඇමුණුම 03, 04, 05 බලන්න.

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද: වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධාරීන් :

I වන කාර්යක්ෂමතා කඩඉම. : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

II වන කාර්යක්ෂමතා කඩඉම. : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

III වන කාර්යක්ෂමතා කඩඉම. : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

09. භාෂා ප්‍රවීණතාවය :

9.1.

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1. III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10. 1. 1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10. 1. 1. 1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වසර දහයක් (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කිරීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10. 2. 1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10. 2. 1. 1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයා ගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

IV. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10. 2. 1. 2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10. 3. 1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10. 3. 1. 1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයා ගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට I ශ්‍රේණියේ වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

IV. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය

(09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය :

- සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිභාහිර වන්නා වූ අර්ථ නිරූපන:

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. අන්තර්ග්‍රහණ විධිවිධාන :

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති PL-02-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය.කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

i. PL-02-III ශ්‍රේණිය

(අ) PL-02-2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ආ) PL-02-2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණ කිරීමට නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්.

PL-02-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබේ.

ii. PL-02-II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි PL-02-2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු එහෙත් අවුරුදු විස්ස (20) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්.

(ආ) PL-02-2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්.

PL-02-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබේ.

iii. PL-02-I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් අවුරුදු විස්ස (20) කට නොඅඩු එහෙත් අවුරුදු තිහ (30) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක විස්ස (20) ක් හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් අවුරුදු නවය (09) කට නොඅඩු එහෙත් අවුරුදු දහ නවය (19) ) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ඇ) PL-02-2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ඉහත සඳහන් සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්.

PL-02-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබේ.

iv. PL-02-විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් වසර තිහ (30) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක තිහ (30) ක් උපයාගෙන ඇති නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහ නවය (19) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහ නවය (19) ක් උපයාගෙන ඇති ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ඈ) PL-02-2016 වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන නිලධාරීන්.

PL-02- විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන - අදාළ නොවේ.

සකස් කළේ : අත්සන ..............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : සී.එස්. අමරවික්‍රම පරිපාලන නිලධාරි - I

තනතුර : බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

දිනය : 2018/06/ 08

පරීක්ෂා කළේ : අත්සන : ..............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. වෙනුර ගුණවර්ධන අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

තනතුර : බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

දිනය : 2018/06/ 08

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ

තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

නිල මුද්‍රාව: බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

දිනය: 2018/06/ 10

යොමු අංකය : MOJ/DRI/ [illegible]/ශි/ සේවා ගණය

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි [illegible] ශිල්පීය සේවා ගණය
තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම :

ලේකම්

........................:අමාත්‍යාංශය

නිල මුද්‍රාව: පියුමන්ති පීරිස්
ලේකම් (වැ.බ)
අධිකරණ අමාත්‍යාංශය

දිනය : 2018/06/

---

යොමු අංකය : PSC/EST/07-01-27/01/2018

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි ප්‍රාථමික ශ්‍රේණි ශිල්පීය සේවා ගණය
සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2018.04.05 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව: නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දිනය : 2018/06/ 07/23

01. වෘත්තීය පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණු : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය

02. වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

2.1 ට්‍රැක්ටර් රියදුරු හා ත්‍රීරෝද රථ රියදුරු

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. මාර්ග නීති<br>II. මාර්ග සංඥා<br>III. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් පත්කරනු ලබන පරීක්ෂකවරයෙකු, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු සහ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය | 100% | 40% |

2.2 . මෝටර් කාර්මික

මේ සඳහා කාලය පැය 06 කි.

I. බ්‍රේක් සකස් කිරීම
II. ක්ලචය සකස් කිරීම
III. හිරවීමේදී ඇතිවන වැරදි සකස් කිරීම හා අලුත්වැඩියා පිළිබඳ හැකියාව සලකා බලනු ලැබේ.

මෙම පරීක්ෂණය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මඟින් පවත්වනු ලැබේ.
( ලකුණු ලබාදෙන ආකාරය පහත දැක්වේ. )

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සේවා සටහන්<br>2. වාචික<br>3. ප්‍රායෝගික | 10<br>40<br>50 | |
| | 100% | 40% |

2.3 මෝටර් කාර්මික (විදුලි) / මෝටර් කාර්මික (වෑද්දුම්)/ මෝටර් කාර්මික (පින්තාරු)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| වෘත්තියට අදාළ කාර්යය පැවරුමක් සිදුකළ යුතු අතර මෙය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මඟින් පවත්වනු ලැබේ. | 100% | 40% |

| සකස් කළේ : | | පරීක්ෂා කළේ : | |
|---|---|---|---|
| අත්සන | : ................ | අත්සන | : ................ |
| නම | : සී.එස්. අමරවික්‍රම | නම | : එම්. චේතුර ගුණවර්ධන |
| තනතුර | : පරිපාලන නිලධාරී - I, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09. | තනතුර | : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09. |
| දිනය | : 2018/06/08 | දිනය | : 2018/06/08 |

අත්සන : ................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.
දිනය : 2018/06/10
නිල මුද්‍රාව :

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති I වන කාණ්ඩය, III, IV, V, VI, VIII, X, XIV, XV |
| මුදල් රෙගුලාසි | I වන පරිච්ඡේදයේ වියදම් හා ආදායම් ඇස්තමේන්තු. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්. අමරවික්‍රම
තනතුර : පරිපාලන නිලධාරී - I
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2018/06/

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එම්. වෙනුර ගුණවර්ධන
තනතුර : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2018/06/

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
දිනය : 2018/06/
නිල මුද්‍රාව :

විභාගය පිළිබඳ ආකෘතිය

ඇමුණුම 03

01.විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 01 | 100% | 40% |

03.විභාගය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

04.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05.විභාගය සඳහා වන විශය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග වල ඇතුලත් සියලුම වගන්ති. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්. අමරවික්‍රම
තනතුර : පරිපාලන නිලධාරී - I, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.
දිනය : 2018/06/ 08

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එම්. වෙනුර ගුණවර්ධන
තනතුර : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.
දිනය : 2018/06/ 08

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.
දිනය : 2018/06/10
නිල මුද්‍රාව : ..................................

විභාගය පිළිබඳ ආකෘතිය　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　　ඇමුණුම 04

01.විභාගයේ නම　　　　: බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02.විභාගය පිළිබඳ විස්තර　:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.ත්‍රිවිල් / ට්‍රැක්ටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග සංඥා පිළිබඳව දැනුම | පැය 01 | 100% | 40% |
| 1.1 මෝටර් කාර්මික/ මෝටර් කාර්මික(විදුලි)/ මෝටර් කාර්මික(වෑද්දුම්)/ මෝටර් කාර්මික(පින්තාරු | පැය 03 | 100% | 40% |

03.විභාගය පවත්වනු ලබන බලධාරියා　　: බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

04.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග　　: වසරකට දෙවරක්

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය　　:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ත්‍රිවිල් / ට්‍රැක්ටර් | 1.ත්‍රිවිල් / ට්‍රැක්ටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග සංඥා පිළිබඳව දැනුම |
| 1.1 මෝටර් කාර්මික/ මෝටර් කාර්මික(විදුලි)/ මෝටර් කාර්මික(වෑද්දුම්)/ මෝටර් කාර්මික(පින්තාරු) | 1.1තනතුරට අදාල කාර්ය පැවරුමක් අදාල කාලය තුල නිම කළ යුතුය. |

සකස් කළේ :
අත්සන　:
නම　:　සී.එස්. අමරවීර
තනතුර　:　පරිපාලන නිලධාරී
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය　: 2018/06/ 07

පරීක්ෂා කළේ :
අත්සන　:
නම　:　එම්. චෙතුර ගුණවර්ධන
තනතුර　:　අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය　: 2018/06/08

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම　:　එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර　:　බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
දිනය　: 2018/06/10
නිල මුද්‍රාව　: ..........